විද්‍යාලය : ර/ ඇඹිලිපිටිය ශ්‍රී මහින්ද මහා විද්‍යාලය
සිංහල භාෂාව හා සාහිත්‍යය : 13 ශ්‍රේණිය පැවරුම්
විෂය භාර ගුරු : ඊ.ඒ.එස්.එච්. ඇතුල්දූර
**නිර්දේශිත ග්‍රන්ථය : ගුත්තිල කාව්‍යය**

ප්‍රශ්නය ඃ **අවස්ථා හා සිද්ධි** නිරූපණයේ දී ගුත්තිල කවියා දක්වන කුසලතාව නිදසුන් දක්වමින් විමසන්න.
(පිළිතුර ලිවීම සඳහා පහත මඟ පෙන්වීම් අදාළ කර ගන්න.)

- ★ කතුවරයා හා කෘතිය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
- ★ උදේනිපුර සැණකෙළි අවස්ථාව

122 කවිය - "රඟත් සුරා පිරූ විතින්
සුරත් තඹුරු පෙති සෙ නෙතින්
පුවත් නොදන බමන ගතින්
නටත් අයෙක් සුරා මතින්"

(අවස්ථාවට උචිත ලෙස යොදා ගත් රිද්මය නිසා **ධ්වනි පූර්ණබවක්** ඉස්මතු වන ආකාරය පවසන්න)

- ★ ගුත්තිල ඇදුරුතුමාගේ වීණා වැයීමේ මිහිරියාව අවට පරිසරය හා බද්ධ කරමින් කරන ලද අවස්ථා නිරූපණය

156 කවිය - "ගොදුරු ලොබ දුරු කර
ඔහු නිවසෙ වට තුරු සිර
නොපැහැර පිය පතර
සියොත්හු ද ඉඳ අසති වෙණ සර"

(සංස්කෘත අලංකාරයන්ගෙන් තොර **ස්වාධීන වර්ණනා** ශෛලියක් උපයෝගී කර ගත් බව)

- ★ කවියෙන් කතන්දර කීමේ කුසලතාව අගයන්න

159 කවිය - "එසේ වුවහොත් හිමි
මම ඔහුට අතවැසි වෙමි
මෙමිල ආපසු දෙමි
මමත් ඔබ යන කල සමග එමි"

(මෙකී අවස්ථා නිරූපණය **ස්වභාවෝක්තිය** දනවන බව පවසන්න)

- ★ අඳ මවුපියන් තම පුතුගේ වීණාව මීයන් කනවා යැයි සිතා අත් ගැසීම.

162 කවිය - "අඳ මවුපිය දෙදෙන
ඔහු වයන බව නොමදැන
කතී වෙණ මීයන
සුසූ යැයි අත ගැසූ සැකයෙන"

(**ජන වහරෙන්** සුපෝෂිත වූ අවස්ථාවක් බව පවසන්න)

- ★ සංවාද සහිත නාටකීය අවස්ථා නිරූපණය

164 කවිය - "උදේනි පුර සිට
වීණා සිප් ඉගැන්මට
ගුත්තිල පඬි වෙතට
ආමි කොද ඒ හිමි කියව මට"

(**කට වහරෙන්** සුපෝෂිත වූ බව පවසන්න)

- ★ මූසිල සම වැටුප් ඉල්ලා සිටි අවස්ථාවේ රජතුමාගේ ප්‍රතිචාරය

188 කවිය - "නොබා අප වාදය
කෙරෙමි යි කියයි වාදය
සොඳේ තොප පෑ දය
ඉගැන්නූ විලස වාදය"

(අවස්ථා නිරූපණයේ දී **උත්ප්‍රාසය** දනවන පද්‍යයක් බව පවසන්න)

- ★ ගුත්තිල ඇදුරිඳුගේ වීණා නාදයට වශී වූ සත්ව ලෝකය

292 කවිය - "කන් කලු වෙණ නද ඇසුමෙහි ලොබිනේ
රන් රසු දූල් කොලහල වන බියෙනේ
සන්සල නොව එහි පිළි රූ ලෙසිනේ
නන් හය සෙන් සිටියෝ සිටි මතිනේ"

(සිද්ධි නිරූපණයේ දී පාඨකයා ප්‍රහර්ශයට පත්කරන්නා වූ **අතිශයෝක්තිය** දනවන පද්‍යයක් බව)

- ★ ගුත්තිල ඇදුරිඳුගේ වීණා නාදයට වශී වූ මානව ලෝකය

292 කවිය - "නිති නිරිඳුගෙ රැකවලෙහි නියුත්තෝ
රැති ලෙස රුපු'නොද බිඳ ජය ගත්තෝ
පැතිරෙන වෙණ නද බැඳුණ සිතැත්තෝ
අති'නව් ගිලිහෙන බව නොම දත්තෝ"

(අවස්ථා නිරූපණයේ දී පාඨකයා තුළ **චිත්ත රූප** මැවෙනා අවස්ථාවක් බව පවසන්න)